වෛරසය ආසාදිත පුද්ගලයින් රෝගීන් මිස අනෙක් අයට රෝගය පතුරුවන පුද්ගලයින් ලෙසින් හැඳින්වීමෙන් වළකින්න' යනුවෙන් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය මගින් කොවිඩ්-19 වාර්තාකරණය සඳහා ඉදිරිපත් කර ඇති නිර්දේශයන් තුළ දැක්වේ.

එනමුත්, කොවිඩ්-19 සම්බන්ධයෙන් වන නවතම වර්ධනයන් ඉදිරිපත් කරනා පුවත් වාර්තාවන් තුළ බොහෝ විට, යම් ප්‍රදේශයක් හෝ ආයතනයක් වසා දැමීම හෝ නිරෝධායනය සම්බන්ධයෙන් ඍජුව හෝ වක්‍රාකාරයෙන් කොවිඩ්-19 ආසාදිතයෙකු වෙත දෝෂාරෝපණය එල්ල කරනු, ඔවුන් නිසා තවත් අයට වෛරසය ආසාදනය වූ බවක් ගම්‍ය කරනු දක්නට ලැබේ. උදාහරණයක් ලෙසින් මව්බිම පුවත්පතේ (11/18) "කොවිඩ් ආසාදිතයෙකු නිසා හේරත්ගම තැපැල්හල වසා දමයි" යන සිරස්තලයෙන් යුතු පුවත අපට විමසිය හැක.

කොවිඩ්-19 ආසාදිත රෝගියා නිසා මෙම තැපැල්හල වසාදැමීමට සිදුවූ බවක් මෙම සිරස්තලය ඔස්සේ ගම්‍ය නොවන්නේද? එසේ වන්නේ නම්, එය පෙර සඳහන් කොවිඩ්-19 වාර්තාකරණය සඳහා වන නිර්දේශය කඩ කිරීමක් සහ ආචාර ධාර්මික මාධ්‍යකරණයට පටහැණි වීමක් නොවන්නේද?

**#COVID19 #Media #MoH_SriLanka #MediaEthicsSL #lka #SinhalaNews #Mawbima**
See Less